විල්ගමුව ප්‍රාදේශීය සභාව

මාතලේ දිස්ත්‍රික්කය

---------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 12 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 සැප්තැම්බර් 09 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

**1.2 මතය**
**------**

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**
**----------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**--------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ගබඩා භාණ්ඩ සම්බන්ධයෙන් ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණු අතර, මිල දී ගනු ලබන ගබඩා තොග ඍජුවම වැය ශීර්ෂවලට හරකර තිබුණි.

(ඇ) මූල්‍ය මෙහෙයුම් හා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ පෙර වර්ෂයේ සංඛ්‍යා සමඟ සංසන්දනාත්මකව ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ශේෂය සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය අතර රු.2,221,340 ක වෙනසක් ද, සේවක ඇප ආයෝජන ගිණුමේ ශේෂය සහ සේවක ඇප ගිණුමේ ශේෂය අතර රු.67,608 ක වෙනසක් ද දක්නට ලැබුණි.

### 1.3.4 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.25,037,865 ක් වූ ගිණුම් විෂයන් 07 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.2,095,599 ක් විය.

### 1.3.5 අවිනිශ්චිත ගිණුම

ඉකුත් වර්ෂ වල සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුමේ වූ රු.657,609 ක බැර ශේෂය නිරවුල් කිරිමට සමාලෝචිත වර්ෂයේදිත් කටයුතු කර නොතිබුණි.

### 1.3.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු. 4,288,359 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක් සහ ගෙවිය යුතු රු.1,136,595 ක් වූ ශේෂ 2 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

### 1.3.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 04 කට අදාළ එකතුව රු.19,804,212 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.8 නීති, රිති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | <u>**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**</u> | |
| **(i)** | 12 (1) (2) වගන්තිය | ප්‍රාදේශීය සභාවේ කටයුතු කරගෙන යාමේ දී උපදෙස් ලබාදීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය, කාර්මික සේවා යන පහසුකම් සම්බන්ධ කමිටු සමාලෝචිත වර්ෂයේ දී පත්කර නොතිබුණි. |
| **(ii)** | 132 (ඒ) වගන්තිය | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු.25,250 ක ක්‍රීඩා උපකරණ ද, පහ වසර ශිෂ්‍යත්වය සමත් සිසුන් 80 කට පදක්කම් ලබා දීම සඳහා රු.24,000 ක් ද වියදම් කර තිබුණි. |
| **(iii)** | 170 වගන්තිය | පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර සහා අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයන් 10 ක් යටතේ අයවැයගත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.1,218,034 ක වියදම් දරා තිබුණි. |
| **(iv)** | 175 (1) වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නොගෙන අනියම්, ආදේශක, දෛනික සහ තාවකාලික පදනම යටතේ බඳවා ගත් සේවකයින් 09 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදි රු.2,071,902 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය** | ණය ගෙවීම් පැහැර හරින ලද සේවකයින් 08 දෙනෙකුගෙන් අය විය යුතු රු.79,323 ක ණය ශේෂ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** | **<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u>** | |
| **(i)** | මුදල් රෙගුලාසි 395 (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දී මාස දෙකකට වැඩි අඛණ්ඩ කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි. |
| **(ii)** | මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 අප්‍රේල් 30 වන විටත් සිදුකර නොතිබුණි. |

### 1.3.9 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ගෙවිම සම්බන්ධ වාර්තා නොයැවීම නිසා ඒ මත ගණන් බලන ලද රු.32,419 ක අධිභාර මුදල ගෙවීමට සිදු වීමෙන් සභාවට පාඩුවක් සිදු වී තිබුණි.

**(ආ)** සභාව විසින් පවත්වාගෙන යන මල්ගම්මන වැලිතොටුපල සඳහා වූ වැලි බලපත්‍රය අලුත් කිරීම සඳහා වූ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශ ලැබීමටත් පෙර පතල් හා කැණීම් කාර්යාංශය වෙත රු.11,660 ක මුදලක් ගෙවා තිබුණ ද, 2013 වර්ෂය සඳහා බලපත්‍රය අලුත්කර නොතිබුණි.

**(ඇ)** ප්‍රාදේශීය සභාවට හෝ පළාත් පාලන ආයතන වලට සම්බන්ධ නොවන රැස්වීමකට සහභාගී වීම සඳහා සභාපතිවරයා විසින් සභා අරමුදලින් රු. 7,500 ක් ගෙවා පෞද්ගලික කුලි වාහනයක් ලබාගෙන තිබුණි.

**(ඈ)** 2013 අප්‍රේල් 21 දින හෙට්ටිපොල සතිපොල පැවැත්වීමට නොහැකි වීම නිසා 2013 මැයි 23 දින ගන්නා ලද මහා සභා තීරණයකට අනුව මාසිකව බදුකුලිය රු.17,200 කින් කපා හැර තිබුණ ද, ඊට විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,313,985 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,977,731 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,336,254 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රාහත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ දෙක තුල ප්‍රාදේශීය සභාවේ ජංගම වගකීම් ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් මට්ටමක ජංගම වත්කම් නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරික්ෂණයන් කෙරේ.

**(අ) වරිපනම්**

----------

සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ හා එතෙක් හිඟ වරිපනම් එකතුව රු.1,030,221 ක් වුවද ඉන් අයකර ගෙන තිබුණේ රු.528,132 ක් හෙවත් සියයට 51 ක් පමණි.

**(ආ) බදුකුලී**

--------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.892,757 ක හිඟ බදුකුලී ශේෂයෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) ජල ගාස්තු**

**------------**

සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ හා එතේක හිඟ ජල ගාස්තු එකතුව රු.2,054,494 ක් වුවද ඉන් අයකර ගෙන තිබුණේ රු.1,323,532 ක් හෙවත් සියයට 64 ක අගයක් පමණි.

**2.3.2 උසාවි දඬ හා මුද්දර ගාස්තු**

**----------------------------**

මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.892,382 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.34,500 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** හෙට්ටිපොල නගරයේ සහ සතිපොලෙහි ඇති පොදු වැසිකිලි ටෙන්ඩර් කැඳවා බදු දී නොතිබුණ නමුත් ගිවිසුම්ගත බැදීමකින් තොරව නගරයේ ඇති පොදු වැසිකිලිය රු.2,000 ක වාර්ෂික කුලියකට බාහිර පුද්ගලයෙකුට ලබා දී තිබුණි. ඔහු විසින් දිනකට රු.500 කට වැඩි ආදායමක් උපයන බවත්, ඒ අනුව වාර්ෂිකව උපයන ආදායම රු.180,000 කට වැඩි බවත් නිරීක්ෂණය විය.

**(ආ)** 2012 දෙසැම්බර් 21 දිනැති අංක 1790 දරන ගැසට් පත්‍රය ප්‍රකාර වැලි බලපත්‍ර ලාභීන් පිළිබඳ තොරතුරු රැස්කර නොතිබීම හේතුවෙන් රු.3,000 ක උපරිමයකට යටත්ව අයකරගත යුතු ව්‍යාපාර බදු මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී නොහැකි වී තිබුණි

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවයෙන් විශ්‍රාම ගොස් වසර 06 කට වැඩි කාලයක් ගතවී තිබුණු සේවකයින් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.103,327 ක් වූ සේවක ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ භාවිතයට යොදවාගෙන තිබෙන කැබ් රථ දෙකෙහි සහ යතුරුපැදි දෙකෙහි අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතුව ඇති කැබ් රථ 02 ක් ද, ට්‍රැක්ටරයක් සහ ට්‍රැක්ටර් ටේලර්යක්ද වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ද. කැබ්රථයක් යතුරුපැදියක් සහ ට්‍රැක්ටරය සහ ටේලරයක් සඳහා රක්ෂණ ආවරණ ද ලබා නොගෙන ධාවනයට යොදවා තිබුණි.

(ඈ) සභාව සතු වාහන වලට ඉන්ධන ලබා ගැනීමේ දී ඉන්ධන ඇණවුම් භාවිතා කර නොතිබුණු අතර වාහනවලට අවශ්‍ය ඉන්ධන ලබා ගැනීමෙන් අනතුරුව රියදුරු විසින් ඉදිරිපත් කරන බිල්පත් වලට මුදල් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර තිබුණි.

(ඉ) සභා බල ප්‍රදේශය තුළ ඉදි කර තිබුණු අනවසර ඉදි කිරීම් 05 ක් පිළිබඳව පරීක්ෂා කර, ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

## 3.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

------------------------------------

සමාලෝචිත වර්ෂයේ දී වටිනාකම රු.793,000 ක් වූ වත්කම් ඒකක 05 ක් නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවතුණි.

## 3.4 හඳුනාගත් අලාභ

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 සැප්තැම්බර් මස රු.4,050,000 ක ට මිල දී ගෙන තිබුණු බස්රථය මාර්ග ප්‍රවාහන කටයුතු සඳහා සේවයේ යෙදවීම තුළින් 2013 පළමු අර්ධ වර්ෂයේදි රු.116,516 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) සභාව සතු කැබ්රථය 2013 මාර්තු 22 දින අනතුරකට භාජනය වී රු.25,831 ක අලාභයක් සිදු වී ඇති බවට වාර්තා කර තිබුණු නමුත්, එම අලාභය අයකරගෙන නොතිබුණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අංක 05, රදුන්නේවැව, මාරක යන ලිපිනයේ ඇති ඉඩමේ පෞද්ගලික ළිඳක් ඉදිකර ගැනීම සඳහා සභා අරමුදලින් රු.24,570 ක වටිනා සිමෙන්ති මිටි 27 ක් ලබා දී තිබුණි.

(ආ) රු.367,221 ක වියදමින් නුගගොල්ල පුස්තකාලය අළුත්වැඩියා කිරීම සඳහා සභාව විසින් නුගගොල්ල සමෘද්ධි බලකාය සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර අදාළ ඇස්තමේන්තු ප්‍රකාරව කළ යුතු වැඩ විෂයන් 03 ක් ඉටුකර නොතිබුණු අතරම තවත් වැඩ විෂයන් දෙකක් සතුටුදායක ලෙස ඉටුකර නොතිබුණි.

(ඇ) ලේඩියංගල පුස්තකාල ගොඩනැගිල්ලේ වැඩ විෂයන් 32 ක අලුත්වැඩියා කටයුතු කිරීම සඳහා බෙදුම් ඇල ගොවි සංවිධානය සමඟ ගිවිසුමකට එළඹී තිබුණ ද, වැඩ විෂය නිමවුම් වාර්තා අනුව තෝරාගත් වැඩ විෂයන් 18 ක් පමණක් ඉටුකර ඒ සඳහා රු.128,677 ක මුදලක් ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව සියලුම වැඩ කොටස් ඉටු නොකිරීම සම්බන්ධව සභාව විසින් කොන්ත්‍රාත්කරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු කෙරෙන කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩ පිළිවෙලකට යොදවා නොගෙන ට්‍රැක්ටරයක් මඟින් දිනපතා නාමිණි ඔය වැවට ඉහළින් ඇති රජයේ ඉඩමට බැහැර කිරීම නිසා පරිසර ගැටළු මෙන්ම ප්‍රදේශයේ ගැවසෙන වල් අලින් සහ වෙනත් සතුන් විසින් කසල සමඟ ඇති පොලිතින් වැනි ද්‍රව්‍ය ආහාරයට ගැනීම තුළින් එම සතුන්ට ද ගැටළු පැන නගින බව නිරීක්ෂණය විය.

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) **(i).** සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මඟින් වැය විෂයන් 03 ක් සඳහා සලසාදී තිබූ රු.357,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා වෙනත් වැය විෂයන්ට මාරු කිරීම් හා ඉතිරි කිරීම් සිදු කර තිබුණි.

**(ii).** තවත් වැය විෂයන් 10 ක් සඳහා ඇස්තමේන්තු කර තිබුණු රු.1,218,034 ක ප්‍රතිපාදන ඉක්මවා එම වැය විෂයන් යටතේ වියදම් දරා තිබුණි.

(ආ) **(i).** සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය මඟින් ආදායම් ශීර්ෂ 17 ක් යටතේ එකතුව රු.1,702,750 ක් වූ ආදායම් උපයා ගැනීමට ඇස්තමේන්තු කර තිබුණු නමුත් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

**(ii).** ආදායම් ශීර්ෂ 05 ක අයවැයගත ආදායම්වලින් උපයාගෙන තිබුණේ 1% සිට 13% අතර පරාසයක අගයක් විය.

ඉහත දැක්වෙන කරුණු අනුව අය වැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්

2014 මාර්තු 31 දින වන විට සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලින් 03 කට පිළිතුරු සපයා නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනු වල වටිනාකමේ රු.958,621 ක් විය.

## 5 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ගබඩා පාලනය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය